# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1718/32 - 2011 අගෝස්තු 12 වැනි සිකුරාදා - 2011.08.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වන වගන්තියේ (4) වැනි උප වගන්තිය යටතේ නිවේදනය

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ (සංශෝධිත) 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රෝහණ රාජපක්ෂ වන මම මේ නියමය මගින් -

1. ඉහත කී පනතේ කාර්යය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇති අති නවීන තාක්ෂණයෙන් යුත් නව්‍ය වානේ කර්මාන්ත ශාලාවක් පිහිටුවීම සහ දැනට අතුරුගිරියේ පිහිටි කර්මාන්තශාලාවේ යන්ත්‍රාගාර ධාරිතාව ඉහළ දැමීම සඳහා වන ව්‍යාපෘතියට අදාළ තොරතුරු සඳහන් නිවේදනය 2011 මැයි මස 30 වැනි දින සහ අංක 1708/1 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද බවත් ;

2. අති නවීන තාක්ෂණයෙන් යුත් නව්‍ය වානේ කර්මාන්තශාලාවක් පිහිටුවීම සහ දැනට අතුරුගිරියේ පිහිටි කර්මාන්ත ශාලාවේ යන්ත්‍රාගාර ධාරිතාව ඉහළ දැමීම සඳහා වන ව්‍යාපෘතිය සඳහා පනතේ 3 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය ප්‍රකාර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති බවත් ;

3. ඉහත කී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය, අති නවීන තාක්ෂණයෙන් යුත් නව්‍ය වානේ කර්මාන්තශාලාවක් පිහිටුවීම සහ දැනට අතුරුගිරියේ පිහිටි කාර්මාන්තශාලාවේ යන්ත්‍රාගාර ධාරිතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය ලෙස හඳුන්වනු ලැබිය යුතු බවත් ;

4. ව්‍යාප්ත කිරීමේ ඒකකය 2011 මැයි මස 19 වැනි දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමේ දිනයේ සිට ඉහත ව්‍යාපෘතිය ආරම්භ විය යුතු බවත් ; සහ

5. මෙම නියමයේ උපලේඛනයේ සඳහන් නිදහස් කිරීම්, එහි සඳහන් සීමා කිරීම්වලට යටත්ව ව්‍යාපෘති සමාගමට අදාළ විය යුතු අතර එහි සඳහන් කාල සීමාව තුළ බලාත්මක විය යුතු බවත් ප්‍රකාශ කරමි.

*උපලේඛනය*

(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සහ එහි සංශෝධන :

බදු ගෙවිය යුතු ලාභය සමාගම උපයන පළමු වසර ආරම්භය සිට හෝ වාණිජමය කටයුතු ආරම්භ කිරීමෙන් වසර දෙකකට (02) පසු, දෙකෙන් එකක් වූ කලින් එළඹෙන කවර හෝ වසර සිට වසර දහයක (10) ආදායම් බදු පනත යටතේ බදු නිදහස්


1A - G 14924— 680 (2011/08)

*උපලේඛනය (සම්බන්ධිතයි)*

කාල පරිච්ඡේදයක්, අනතුරුව, වසර දහයක (10) බදු නිදහස් කාල පරිච්ඡේදයට ඉක්බිතිව එළඹෙන තවත් වසර පහක (05) කාල පරිච්ඡේදයකට සෑම තක්සේරු වසර සඳහාම එවැනි කාලය තුළ අදාළව බල පවතින බදු අනුපාතිකයට අනුව අඩකට සමාන අර්ධ නිදහසක් ලබා දෙනු ලැබේ. පැහැදිලි කිරීමක් වශයෙන්, ඉහත විදහා පෙන්වා දී තිබෙන වසර පහළොව (15) ඉකුත්වීමෙන් පසුව එකල් බල පවතින සාමාන්‍ය බදු රාමුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගම කෙරෙහි අදාළ වනු ඇත.

කෙසේවෙතත්, 2006 අංක 13 දරන ආර්ථික සේවා පනත යටතේ 0.25% ක ආර්ථික සේවා අයකිරීමක් අදාළ වනු ඇත.

(ආ) *2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සහ එහි සංශෝධන :*

ව්‍යාපෘති සමාගම සහ ආයෝජන මණ්ඩලය අතර මේ සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුම ගිවිසගත් දිනයේ සිට මණ්ඩලයේ අනුමැතිය ඇතිව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වසර පහක (05) කාල පරිච්ඡේදයක් තුළ ව්‍යාපෘතියට අදාළ ප්‍රාග්ධන භාණ්ඩ හා ඉදිකිරීම් අයිතමයන් මත එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබේ.

(ඇ) *2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන අයකිරීම් පනත :*

ව්‍යාපෘති සමාගම සහ ආයෝජන මණ්ඩලය අතර මේ සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුම ගිවිසගත් දිනයේ සිට මණ්ඩලයේ අනුමැතිය ඇතිව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වසර පහක (05) කාල පරිච්ඡේදයක් තුළ ව්‍යාපෘතියට අදාළ ප්‍රාග්ධන භාණ්ඩ හා ඉදිකිරීම් අයිතමයන් මත වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන අයකිරීම් ගෙවීමෙන් නිදහස ලබා දෙනු ලැබේ.

(ඈ) *2011 අංක 10 දරන ජාතිය ගොඩනැංවීමේ බදු පනත :*

ව්‍යාපෘති සමාගම සහ ආයෝජන මණ්ඩලය අතර මේ සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුම ගිවිසගත් දිනයේ සිට මණ්ඩලයේ අනුමැතිය ඇතිව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වසර පහක (05) කාල පරිච්ඡේදයක් තුළ ව්‍යාපෘතියට අදාළ ප්‍රාග්ධන භාණ්ඩ හා ඉදිකිරීම් අයිතමයන් මත ජාතිය ගොඩනැංවීමේ බදු ගෙවීමෙන් නිදහස ලබා දෙනු ලැබේ.

(ඉ) *(235 වැනි අධිකාරිය වූ) රේගු ආඥාපනත :*

සෘණ ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ හැරුණුවිට ව්‍යාපෘතියට අදාළව ආනයනය කරනු ලබන ප්‍රාග්ධන භාණ්ඩ සහ ඉදිකිරීම් අයිතමයන්වලට රේගු බදු අයකිරීම්වලින් නිදහස් කිරීම අදාළ වේ. කෙසේවෙතත්, දේශීය වෙළඳපලේ එවැනි භාණ්ඩ අවශ්‍ය ප්‍රමාණයෙන් නොලැබෙන විට ව්‍යාපෘති සමාගම සහ ආයෝජන මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුම ගිවිසගත් දිනයේ සිට මණ්ඩලයේ අනුමැතිය ඇතිව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වසර පහක (05) කාල පරිච්ඡේදයක් තුළ සෘණ ලැයිස්තුවේ සඳහන් අයිතම් සැලකිල්ලට ගනු ලබනු ඇත.

(ඊ) *අමුද්‍රව්‍ය ආනයනය කිරීම :*

ඉහතකී කම්හල් සඳහා ආනයනය කෙරෙන අමුද්‍රව්‍ය මත වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන අයකිරීම් අදාළ නොවන අතර මණ්ඩලයේ අනුමැතිය ඇතිව අළුත් මැඩි වානේ මෝල වාණිජමය කටයුතු ආරම්භ කිරීමට මාස හයකට ප්‍රථමයෙන් හෝ අළුත් මැඩි වානේ මෝල සඳහා ආනයනයන් සිදු කරන ලද පළමු දිනය දෙකින් පසුව එළඹෙන දිනය සිට වසර අටක (08) කාල පරිච්ඡේදයකට ඇත්නම් රේගු ආනයන බද්දෙන් නිදහස ලබා දෙනු ලැබේ.

බැසිල් රෝහණ රාජපක්ෂ, පා.ම,
ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2011ක් වූ අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ දී ය.

08-687

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.